සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය

**නම/විභාග අංකය :- ..................................................................................... කාලය : පැය 02යි.**

**I නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. 'ඇහැල මහට ඇහැල ගහක' යන ස්වර ස්ථාපන ගීතය අයත් රාගය වන්නේ,
   i. බිලාවල් රාගය ii. කාෆිරාගය iii. භූපාලි රාගය iv. රාගයකට අයත් නොවේ.

2. x x| x x x| x x| x x x මෙම රිද්ම රටාව ඔබ උගත් එක්තරා තාලයකට සමාන ය. එම තාලය වන්නේ,
   i. දීප්චන්දි ii. දාදරා iii. කෙහෙර්වා iv. ඣප් තාලය

3. සරල ගීතයක ආකෘතිය වන්නේ,
   i. ස්ථායී, අන්තරා, තානාලංකාර, තනුව
   ii. පෙර වාදන, අතුරු වාදන, ස්ථායී, අන්තරා
   iii. ආලාප, පෙර වාදන, අන්තරා, ස්ථායී
   iv. පෙර වාදන, ස්ථායී, අතුරු වාදන, අන්තරා

4. නෙළුම් ගී අයත්වන ගී විශේෂය වන්නේ,
   i. මෙහෙ ගී ii. ඇඳහිලි ගී iii. සරල ගී iv. නාට්‍ය ගී

5. කෝමළ ස්වර ඇතුළත් ස්වර පේළිය වන්නේ,
   i. ස ස ග ශ| රි රි ග| ස රි| ග
   ii. ස ස රි ධ| ගු රි ස| රි රි ම |ම ප
   iii. ධ ස ස ස| රි ග ප |ම ප ම ග |රි ග රි
   iv. ස ග ග| ම ප ප| ම ග රි| ස ස ස

**I පහත සඳහන් පද ගැලපෙන සේ යොදා හිස්තැන් පුරවන්න.**
(නව නාට්‍ය, සමග්‍රහය, බලිය, සිරිලංකා රජිද්‍රාමේ, තබ්ලාව, එස්රාජය)

6. අන්න බලන් සඳ රන්තැටියෙන් යන ගීතය ........................... ගී ගණයට අයත් වේ.
7. තාලයක පළමු මාත්‍රාවේ X ලකුණෙන් සංකේතවත් කරන්නේ ................................. වේ.
8. සිතාරයේ ස්වර පිහිටීමට සමාන වන තවත් භාණ්ඩයක් වන්නේ .................................................. යි.
9. ............................................ ගීතය ශ්‍රී වික්‍රමරාජසිංහ නූර්තියේ එන ගීතයකි.
10. හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ................................................ යි


**I අංක 11 සිට 15 දක්වා දී ඇති වගන්තිවල ප්‍රකාශ නිවැරදි නම් (√ ) ලකුණ ද වැරදිනම් (X) ලකුණ ද යොදන්න.**

11. නෙළුම් ගී ගායනයේදී තබ්ලාව වයයි. (..............)
12. හින්දුස්ථානි තාලයක විභාගය හැඳින්වීමට බටහිර සංගීතයේදී "BAR" යන නම භාවිත කරයි. (..............)
13. ''අම්මා සඳකි මම ඒ ලොව'' ගීතය බැති ගීයකි. (..............)
14. ''චින්න චින්න ආසෛයි සිරහඩික්කුම් ආසෛයි'' හින්දි ගීතයකි (..............)
15. ''ගමන බිමන හරි කඩිසර'' මෙහි ලඝු අකරු දොළහකි. (..............)

**I 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රහෙලිකාව ඇසුරෙන් සකසන්න.**

<u>**පහලට**</u>

16. සිරස නමමු මව් පොළොවට යන ස්වර ස්ථාපන ගීතය අයත් රාගය මේ නමින් හැඳින්වේ.
18. ජෝන්ද සිල්වා ශූරීන් මෙම නාට්‍ය ශෛලිය සඳහා සුවිශේෂ සේවාවක් කර ඇත.
19. සිතාරය සහ එස්රාජය අයත් සංගීත භාණ්ඩ වර්ගය මේ නමින් හැඳින්වේ.




<u>**හරහට**</u>

17. තාල පදයක පළමු මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව තෙක් එක් වරක් වාදනය කිරීම මේ නමින් හැඳින්වේ.
20. තාලම්පටින් නිකුත් වන ධ්වනි දෙකෙන් එකකි. (ලකුණු 1X20=20)

---

## ii **කොටස**

**I පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.**

1. i. බිලාවල් රාගය හා භූපාලි රාගයේ ආරෝහණ අවරෝහණ ස්වර ලියන්න. (ලකුණු 2)
   ii. ඔබ ආරෝහණ අවරෝහණ ලියන ලද රාගයේ ස්වර ස්ථාපන ගීතයේ මුල් කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ලකුණු 2)
   iii. ඔබ උගත් භජන් ගීතයක මුල් පේළි හතර ලියන්න. (ලකුණු 2)
   iv. සිතාරයේ ප්‍රධාන තත නම් කරන්න. එය වාදනය කරනු ලබන උපකරණයේ නම කුමක් ද? (ලකුණු 2)
   v. ''සිරිසරු සාර කෙතේ'' ගීතය ගයන ගායකයා කවුරුන් ද? (ලකුණු 2)

2. i.

<table>
<tr><th>තාලයේ නම</th><th>මාත්‍රා</th><th>විභාග</th><th>ඒකාව</th></tr>
<tr><td></td><td>10</td><td></td><td>ධි නා | ධි ධි නා | නා | ධි ධි නා</td></tr>
<tr><td></td><td></td><td>4</td><td>ධා ධිං | ධා ධා ධිං | තිං ධ ධ ධිං</td></tr>
</table>

(ල 4X2=8)

   ii. මෙම තාල් දෙකට ගැලපෙන රිද්ම රටා 2 ක් අඳින්න . (ලකුණු 2)

3. i. නූර්ති හා නාඩගම් නිර්මාණය කළ නිර්මාතෘවරුන් වෙන වෙනම ලියන්න. (ලකුණු 2)
   ii. නූර්ති හා නාඩගම් නාට්‍ය වල නම් දෙක බැගින් ලියන්න. (ලකුණු 2)
   iii. නූර්ති හා නාඩගම් නාට්‍ය ශෛලීන් පිළිබඳව ඔබ දන්නා කරුණු 3 බැගින් වෙන වෙනම ලියන්න (ලකුණු 4)
   iv. නූර්ති හා නාඩගම් නාට්‍ය සඳහා යොදාගන්නා වාද්‍ය භාණ්ඩ වෙන වෙනම ලියන්න. (ලකුණු 2)

4 ''සරණයි සරණයි බුද්ධං සරණයි''
   i. ඉහත ගී පාදයේ සඳැස් මත් ගණන කීය ද? (ලකුණු 4)
   ii. ඉහත ගී පාදයේ ගීමත් ගණන කීය ද? (ලකුණු 4)
   iii. මෙම ගී පාදය අයත් ගී විශේෂය නම් කරන්න. (ලකුණු 2)

5. i. ස්වර පුවරුවක් ඇඳ, එහි කෝමළ ග,නි ඇතුළත් ස්වර සප්තකය ලකුණු කර දක්වන්න.
   (ස්වර පුවරුව ඇඳීමට ල. 3) (ස්වර 7 නම් කිරීමට ල. 3)
   ii. සිතාරය හා එස්රාජය යන සංගීත භාණ්ඩ පිළිබඳව ඔබ දන්නා කරුණු 4 ක් වෙන වෙන ම ලියන්න. (ල. 4)
   (ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## ප්‍රායෝගික පරීක්ෂණය

**නම/විභාග අංකය :-** ..........................................................................................

| | | | |
|---|---|---|---|
| 1. රාගාශ්‍රිත ගී | i | ඔබ උගත් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් ගයන්න/ වයන්න | 10 |
| 2. ජන ගී | | නෙළුම් ගී, ගොයම් ගී, කමත් ගී වලින් එකක් ගයන්න/ වයන්න | 10 |
| 3. ව්‍යවහාරික සංගීතය | i<br>ii | නූර්ති ගී / නව නාට්‍ය ගී/ නාඩගම් ගී වලින් එකක්<br>භජන් ගී / ද්‍රවිඩ වලින් එකක් | 5<br>5 |
| 4. තාල | i<br>ii | ගුරුවරයා ගයන ගීයට අනුව අවනද්ධ භාණ්ඩයකින් තාල තැබීම<br>ජප්/ දීප්දන්දි තාල අතින් තබන්න | 5<br>5 |
| 5 වාදනය | i<br>ii | තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයකින් ගීතයක් වාදනය<br>ස්වර පුවරුවෙන් ගීතයක් වාදනය | 5<br>5 |

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| (1) 3 | (2) 4 | (3) 4 | (4) 1 | (5) 2 |
| (6) නව නාට්‍ය | (7) සමග්‍රහය | (8) එස්රාජය | (9) සිරි ලංකා රජින්දා | (10) තබ්ලාව |
| (11) 5 | (12) 4 | (13) 5 | (14) 5 | (15) 4 |
| (16) බිලාවල් | (17) ආවර්තය | (18) නූර්ති | (19) තත් | (20) තිත |

(ලකුණු 20)

### II පත්‍රය

1. i. ස රි ගම ප ධ නිස් ආරෝහණ
   සනි ධ ප මග රි ස අවරෝහණ (ලකුණු 02)
   ii. බිලාවල් රාගයේ ස්වර ස්ථාපන ගීතයේ මුල් පාද දෙක ගීත ස්වර ලියා තිබිය යුතුය. ලකුණු 02)
   iii. ඕනෑම භජන් ගීතයක පාද හතරක් සෑහේ. (ලකුණු 02)
   iv. ප්‍රධාන තත නායකී තාර් උපකරණය මිශ්‍රාබය (ලකුණු 02)
   v. ආනන්ද සමරකෝන් (ලකුණු 02)

2. i.

| තාලයේ නම | මාත්‍රා | විභාග | ඨේකාව |
|---|---|---|---|
| ජප් තාලය | 10 | 4 | ධින/ධිධින/තින/ධිධින/ |
| දීප්චන්දි තාලය | 14 | 4 | ධධිං/ධධධිං/තතිං/ධධධිං |

(2 x 4 = 8)

   ii. ඕනෑම රිද්ම රටා 2ක් අඳින්න. (ලකුණු 02)

3. i. නූර්ති ජෝන් ද සිල්වා, සී දොන් බස්තියන්, චාල්ස් ඩයස්
   නාඩගම් පිලිප්පු සිංඤෝ, ක්‍රිස්තියන් පෙරේරා (ලකුණු 02)
   ii. නූර්ති සිරිසඟබෝ, විදුර, පද්මාවතී, ශ්‍රී වික්‍රම, හේමමාලා ආදිය....
   නාඩගම් ඇහැළේපොල, සිංහවල්ලි, බ්‍රම්ෆෝඩ්, බැලසන්ත, ඉයුජින් (ලකුණු 02)
   iii. කරුණු 3 බැගින් ලිවීමට (ලකුණු 04)
   iv. නූර්ති, තබ්ලාව, සර්පිනාව
   නාඩගම් මද්දලය (ලකුණු 02)

4. i. සඳැස්මත් 16 (ලකුණු 04)
   ii. ගීමත් 24 (ලකුණු 04)
   iii. තුන්සරණේ ගීතය (ලකුණු 02)

5. i. ස්වර පුවරුව ඇඳීමට (ලකුණු 03)
   ස්වර නම් කිරීමට (ලකුණු 03)
   ii. සිතාරයේ සහ එස්රාජයේ කරුණු දෙක බැගින් කරුණු හතරක් සඳහා (ලකුණු 04)
   විශේෂිත ම කරුණු සඳහා උපරිම ලකුණු ලබා දිය යුතුය.